**නවිදාන්වැලි ප්‍රාදේශිය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන .**

**------------------**

**1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**-------------------------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 22 දිනය විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 අගෝස්තු 31 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2011 දෙසැම්බර් 21 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .**

**1.2 . මතය .**

**----------**

**මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ නවිදාන්වැලි ප්‍රාදේශිය සභාව2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට නවිදාන්වැලි ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.**

**1.3 . මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම .**

**--------------------------------------------**

**1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .**

**----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .**

**( අ ) උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර නොතිබුණි .**

( ආ ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

**1.3.2 .** ගණකාධිකරණ අඩුපාඩු .

----------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ .

( අ ) **1987** අංක **15** දරන ප්‍රාදේශිය සභා පනතේ **172 ( 2 )** වගන්තිය ප්‍රකාරව ගිණුම් වල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

( ආ ) රු . **899,420** ක් වු භාණ්ඩ හා සේවා බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකොට ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමෙහි දක්වා තිබුණි .

( ඇ ) සභාවේ කල් ඉකුත්වූ තැන්පතු ගිණුමෙහි වූ රු. **112,790** ක මුදලක් ආදායමට බැර නොකොට එම ගිණුමෙහි රඳවා ගෙන තිබුණි .

**1.3.3 .** අනුකූල නොවීම් .

---------------------

විගණනයේදි නිරික්ෂණය වූ නීති , රිති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් පහත දැක්වේ .

| නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | | අනුකූල නොවීම් . |
|---|---|---|
| ( අ ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන ) රීති - **1988** . | | අනුකූල නොවීම් . |
| රීති අංක **180** | - | මුදල් සහ ගබඩා පරිහරණය කරන නිලධාරින් ආරක්ෂිත ඇප තබා නොතිබුණි . |

| | | |
|---|---|---|
| රීති අංක 217 | - | සභාව පීඑස් 46 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි . |
| රීති අංක 218 | - | සුදුසු නිලධාරියෙකු විසින් ඉඩම් සහ ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි . |

( ආ ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි .

| | | |
|---|---|---|
| මු.රෙ. 396 | - | වටිනාකම රු. 500 ක් වූ මුදල් නොකළ චෙක්පත් 10 ක් සභාවේ ආදායමට බැර කර නොතිබුණි . |

## 2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

### 2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු . 5,984,613 ක් වූ අතර එයට ප්‍රතිරැපීව ඉකුත් වර්ෂය සදහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු . 1,482,659 ක් විය .

### 2 . 2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| | ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත . | තථ්‍ය . | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| i | වරිපනම් සහ බදු | 05 | - | - |
| ii | කල්බදු | 1,435 | 1,239 | 3,349 |
| iii | බලපත්‍ර ගාස්තු | 165 | 126 | 3 |
| iv . | වෙනත් ආදයම් | 400 | 893 | - |

2.2.2 උසාවි දඩ

සමන්තුරේ මහේස්ත්‍රාත් උසාවිය විසින් 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගන්නා ලද රු. 86,500 ක් වූ උසාවි දඩ අයකර ගෙන පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරිමට කටයුතු කර නොතිබුණි .

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි .

2.2.4 ආදායම් ණයගැතියෝ

සභාව ආදායම් ණයගැතියන් ගෙන් රු. 2,288,105 ක් වු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .

මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුල ලබා ගත් රු . 15,055 ක් වූ මුදලක් මෙ දක්වා පියවා නොතිබුණි .

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත වියදම, තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 000 | රු. 000 | රු. 000 |
| පුද්ගල පඩිනඩි | 6,261 | 7,097 | (836) |
| වෙනත් | 2,481 | 8,668 | (6,187) |
| උප එකතුව | 8,742 | 15,765 | (7,023) |
| ප්‍රාග්ධන වියදම් | 5,050 | 7,342 | (2,292) |
| මුළු එකතුව | 13,792 | 23,107 | (9,315) |

2.4 . මානව සම්පත් කළමනාකරණය .

අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය .

**2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ**

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | - |
| ද්විතියික ශ්‍රේණිය | 08 | 12 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 10 | 09 |
| වෙනත් | - | - |
| | 19 | 21 |

2.5 . වත්කම් කළමනාකරණය .

-------------------------------

**(අ)** සභාව විසින් උප සභාපතිවරයා වෙත **2009** ජනවාරි **02** දින ලබාදෙන ලද මොටෝ පම්ප් පිෆාන් **(Moto Pump Lifan ) (802 BO-4-80)** මේ දක්වා ආපසු භාර දී නොතිබුණි . එහි වර්තමාන වටිනාකම රු. **67,500** ක් වේ .

**(ආ)** **2010** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු ගිණුම් වල වටිනාකම රු. **352,015** ක් විය . එම මුළු ශේෂයම වර්ෂයකට අධික කාලයක් හිඟව පැවතුණි .

**(ඇ)** **2010** දෙසැම්බර් **31** දිනට අයවිය යුතු සේවක ණය එකතුව රු. **2,033,090** ක් විය . එයින් වර්ෂ දෙකකට වඩා හිඟව පැවති ශේෂයන් ගේ එකතුව රු. **38,584** ක් විය .

**2.6 .** අභ්‍යන්තර විගණනය .

---------------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

**3 .** පද්ධති හා පාලන .

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**( අ )** ගිණුම්කරණය .

**( ආ )** ස්ථාවර වත්කම් පාලනය .

**( ඇ )** ආදායම් පරිපාලනය .